# ශ්‍රී ලංකා මුද්‍රණ විශිෂ්ටතා සම්මාන 2018 තරඟ ඉසව්

## පින්තූර, චිත්‍ර බහුල, සම්ප්‍රදායික මුද්‍රණ ක්‍රම මගින් මුද්‍රණය කල ද්‍රව්‍ය

1, තනි පිටුවේ දින දර්ශන අඟල් 11.69 × 16.53 වැඩි

2, පිටු එකකට වඩා වැඩි දින දර්ශන

3, සඟරා සහ වාර ප්‍රකාශන

4, අළෙවි ද්‍රව්‍යඃ කුඩා පොත්, අත් පත්‍රිකා, ෆෝල්ඩර, අළෙවි ස්ථාන ප්‍රදර්ශක, නාමාවලි

5, කොෆී ටේබල් පොත්

6, පෝස්ටර

## පින්තූර, චිත්‍ර බහුල, ඩිජිටල් යන්ත්‍ර මගින් මුද්‍රණය කල ද්‍රව්‍ය

7, තනි පිටුවේ දින දර්ශන අඟල් 11.69 × 16.53 වැඩි

8, පිටු එකකට වඩා වැඩි දින දර්ශන

9, අළෙවි ද්‍රව්‍යඃ කුඩා පොත්, අත් පත්‍රිකා, ෆෝල්ඩර, අළෙවි ස්ථාන ප්‍රදර්ශක, නාමාවලි

## ප්‍රධාන වශයෙන් අකුරු මෝස්තර, නිර්මාණශීලී භාවය, සැලසුම, සංකල්ප මත ඇගයුම් කරන සම්ප්‍රදායික ක්‍රම හෝ ඩිජිටල් යන්ත්‍ර මගින් මුද්‍රණය කල නිශ්පාදන

10, කාර්යාල දින දර්ශන

11, වාර්ශික සමාගම් වාර්තා පොත්

12, පිට කවරයේ පමණක් බහු වර්ණ සහිත තනි වර්ණ පොත් , දිනපොත්

13, සුබ පැතුම් පත්, ඇරයුම් පත්

14, ලිපිශීර්ෂ, විසිටින් කාඩ්, ලිපි ද්‍රව්‍ය

## විවිධ අලංකාර, ආලේපන, යෙදුම් භාවිතා කල සම්ප්‍රදායික ක්‍රම මගින් මුද්‍රණය කල ඇසුරුම් ද්‍රව්‍ය

15, අවමව එම්බොස්, ෆොයිල්, ස්පර්ශාත්මක වානිෂ් ආදී අලංකාර 2 ක් යෙදූ ප්‍රොසෙස් සහ ස්පොට් වර්ණ 5 කට නොඅඩු බොක්ස් බෝඩ් ඇසුරුම්

16, අවමව එම්බොස්, ෆොයිල්, ස්පර්ශාත්මක වානිෂ් ආදී අලංකාර 2 ක් යෙදූ අවම වර්ණ දෙකක් සහිතව මුද්‍රිත හෝ වෙල්වට් හෝ වෙනත් විශේෂ ඇතුළු ස්ථරයක් සහිතවූ තෑගි පෙට්ටි

17, අවමව එම්බොස්, ෆොයිල්, ස්පර්ශාත්මක වානිෂ් ආදී අලංකාර 2 ක් යෙදූ ප්‍රොසෙස් සහ ස්පොට් වර්ණ 5 කට නොඅඩුව ඕනෑම දෙයක් මත මුද්‍රිත ලේබල් සහ එල්ලන ලේබල්

විවිධ අලංකාර, ආලේපන, යෙදුම් භාවිතා භාවිතා නොකල  ප්‍රොසෙස් හෝ ස්පොට් වර්ණ 4 කට නොඅඩුව යෙදූ සම්ප්‍රදායිකව මුද්‍රණය කල ඇසුරුම් ද්‍රව්‍ය

18, බොක්ස් බෝඩ් ඇසුරුම්

19, කඩදාසි ලේබල් සහ ඇල්ලන ලේබල්

20, කඩදාසි නොවන ලේබල් සහ ඇල්ලන ලේබල්

21, සොල්වන්ට් මූලික තීන්ත භාවිතකල නම්‍යශීලී ඇසුරුම්

22, සොල්වන්ට් මූලික නොවන තීන්ත භාවිතකල නම්‍යශීලී ඇසුරුම්

ඩිජිටල් යන්ත්‍ර මගින් මුද්‍රණය කල ඇසුරුම් ද්‍රව්‍ය

23, කඩදාසි උපස්ථර මත මුද්‍රිත

24, නම්‍යශීලී උපස්ථර මත මුද්‍රිත

වෙබ් ඕෆ්සෙට් මුද්‍රිත ද්‍රව්‍ය

25, නිවුස්ප්‍රින්ට් භාවිත පලල් පිටු පුවත්පත්

26, නිවුස්ප්‍රින්ට් නොවන කවර භාවිතා කල හෝ නොකල ටැබ්ලොයිඩ් පුවත්පත්

ඩිජිටල් සහ ස්ක්‍රීන් මුද්‍රිත අනෙකුත් ද්‍රව්‍ය

27, පොත්, සඟරා, කොෆී ටේබල් පොත්

28, තිර මුද්‍රිත ද්‍රව්‍ය, පලළ උපස්ථර මත ඩිජිටල් මුද්‍රිත ද්‍රව්‍ය

## ශ්‍රී ලංකා ප්‍රින්ට් 2018 (කොලේට්) තරග කොන්දේසි

ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමය විසින් සෑම වසර දෙකකට වරක්ම සංවිධානය කරනු ලබන ලාංකීය මුද්‍රණ විශිෂ්ටත්වය ඇගයීම උදෙසා වූ 'ශ්‍රී ලංකා ප්‍රින්ට්' සම්මාන උළෙල 26 වැනි වතාවටත් සංවිධානය කොට ඇති බව සතුටින් දැනුම් දෙමු.

ඉතාමත් ඉහළ තත්ත්වයකට මුද්‍රිත භාණ්ඩ නිමා කිරීමේ විශිෂ්ටත්වය ඇගයීම හා ඒ සම්බන්ධයෙන් උපහාර පිදීමත්, තරගකාරී විශ්ව වෙළඳපල තුළට ලාංකීය මුද්‍රණකරුවන් ගෙන යාමට ඔවුන්ට ලබා දෙනු ලබන ධෛර්යයක් හා මඟ පෙන්වීමක් ලෙස මෙය හඳුන්වා දීම මුද්‍රණකරුවන්ගේ සංගමයේ පරමාර්ථය වී ඇත.

ශ්‍රී ලංකා ප්‍රින්ට් උළෙලේ තවත් අරමුණක් වනුයේ නවීන මුද්‍රණ තාක්ෂණයේ දියුණුව කෙරෙහි සෑම දෙනාගේම අවධානය යොමු කරවීමයි. මෙමගින් මුද්‍රණ කර්මාන්තයේ සංවර්ධනය සහ එහි පවතින රැකියා අවස්ථා සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම අරමුණු වේ.

## තරග නීති

1. තරගය ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමයේ සාමාජිකයන් වන සියලු මුද්‍රණකරුවන් සඳහා විවෘත වන අතර දැනට සාමාජිකත්වය ලබා නොමැති පුද්ගලයන්ට සහ ආයතනවලට මේ සමග ඇති සාමාජිකත්ව අයදුම් පත්‍රය පුරවා එමගින් එකවරම සාමාජිකත්වය ද ලබාගත හැකිය.

2. තරගය සඳහා ඉදිරිපත් කෙරෙන නිර්මාණ 2016 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව තුළ මුද්‍රණය කර තිබිය යුතුය.

3. පූර්ව මුද්‍රණ කටයුතු සඳහා ආනයනික සැපයුම් යොදාගත හැකි වුවද සියලු නිර්මාණ ශ්‍රී ලංකාවේ ඔවුන්ගේම මුද්‍රණාලයන් තුල මුද්‍රණය කර තිබිය යුතුය.

4. සියලු නිර්මාණ සාමාන්‍ය නිෂ්පාදන ක්‍රියාවලියෙන් ලබාගත් ඒවා විය යුතු අතර තරගය සඳහාම විශේෂයෙන් මුද්‍රණය කල ඒවා නොවිය යුතුය.

5. අදාල ලූමිනස් ස්ටිකරයෙහි විස්තර අසම්පූර්ණව හෝ වැරදි ලෙස සපයා ඇති සියලු නිර්මාණ තරගයෙන් ඉවත් කෙරෙනු ලබන අතර කෙසේ වුවද එම නිර්මාණ ප්‍රදර්ශනයේදී භාවිතා කරනු කෙරෙනු ඇත.

6. තරගකරුවන් තිදෙනෙකු හෝ ඊට අඩුවෙන් ඉදිරිපත්වනු ලබන ඕනෑම අංගයක් තරගාවලියෙන් ඉවත් කෙරේ. කෙසේ වුවද එම නිර්මාණ ප්‍රදර්ශනය සඳහා අදාල වනු ඇත.

7. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2018 පෙබරවාරි 28 වැනිදා වේ.

8. 2018 මාර්තු 18 ඉරු දින ශැන්ග්‍රි-ලා හෝටලයේ පැවැත්වෙන සම්මාන ප්‍රදානෝත්සවයේදී ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

9. පුවත්පත් මුද්‍රණ ආයතන මෙම තරගයට ඉදිරිපත් වීමේ දී අයදුම්පත් සඳහා සුදුසු කම් ලබන අවසන් දින දක්වා වූ දෙවසර ඇතුළත මුද්‍රණය කරන ලද, දින තුනක පුවත්පත් පිටපත් 2 බැගින් ඉදිරිපත් කළ යුතුය.

## තරගයට ඇතුළත්වීමේ ක්‍රමය

1. ඔබට අවශ්‍ය ඇතුළත් කිරීම් සංඛ්‍යාවක් ඕනෑම ඉසව්වකට ඉදිරිපත්කල හැකිය.

2. සෑම ඉදිරිපත් කිරීමක් සමගම විනිශ්චය කටයුතු සඳහා නිර්මාණයන්ගේ එක හා සමාන සාම්පල දෙකක් ඉදිරි පත් කල යුතු අතර මුද්‍රණකරුවන්ගේ සංගම් කාර්යාලය සමග කලින් යොදාගත් සැලසුමක් නොමැති අවස්ථාවකදී හැර මෙම සාම්පල නැවත ලබා දෙනු නොලැබේ.

3. ඇතුළු කරනු ලබන සෑම සාම්පලයක් සඳහාම අදාල ලූමිනස් ස්ටිකරය අවශ්‍ය විස්තර පුරවා නිර්මාණයේ ඉහල දකුනු පස කොනෙහි ඇලවිය යුතුය.

4. ඉන්පසු සෑම සාම්පලයක් සඳහාම අදාළ විශාල ප්‍රමාණයේ ස්ටිකරය අවශ්‍ය විස්තර පුරවා නිර්මාණයේ පිටුපස ඇලවිය යුතුය.

5. සියලුම තරග සාම්පල (සාම්පල දෙකක් සහිත) විනිවිද පෙනෙන ප්ලාස්ටික් බෑගයක ඇතුළත් කළ යුතුය.

6. ඉතා කුඩා ප්‍රමාණයේ නිර්මාණ, විසිටින් කාර්ඩ් හා ටැග් වර්ග වැනි සාම්පල A5 ප්‍රමාණයේ හෝ විශාල ප්‍රමාණයේ සුදු පැහැ බොක්ස් බෝඩ් පුවරුවක අලවා ඉදිරිපත් කළ යුතුය.

7. සහභාගි වන සෑම තරගකරුවකු විසින්ම එක් අයදුම්පත්‍රයක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

8. ඔබ ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා නොමැති නම් මේ සමග ඇති සාමාජිකත්ව අයදුම්පත්‍රය ද සම්පූර්ණ කර එවිය යුතුය.

9. ඔබගේ නිර්මාණ අයදුම්පත් හා අදාල ගෙවීම් අවසන් දිනයට පෙර ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමය වෙත ලැබෙන සේ තැපැලෙන් එවීම හෝ ගෙනවිත් බාරදීම කළ හැකිය.

ඔබට යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් කරුණාකර දුරකතන අංකය: 011 2741750, 2741979 / ෆැක්ස්: 011 2741899 හෝ ඊමේල් slap@srilankaprinters.com ඔස්සේ ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමයේ පරිපාලන ලේකම් අමතන්න.

## විනිශ්චය ක්‍රියාවලිය

මුද්‍රණ කර්මාන්තය හා මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත තාක්‍ෂණය පිළිබඳ වෘත්තිකයන් ගෙන් සැදුම්ලත් අන්තර් ජාතික විනිසුරු මඩුල්ලක් මගින් විනිශ්චය කටයුතු සිදුකෙරෙනු ඇති අතර ඔවුන් ශ්‍රී ලංකා මුද්‍රණ කර්මාන්තය සම්බන්ධයෙන් අපක්‍ෂපාතීව කටයුතු කරන බව සහතික කරනු ඇත.

තරග විනිශ්චය වට තුනකින් සිදු කරනු ඇත.

## පළමු වටය

තරඟාවලියේදී වැඩිදුර සලකා බැලීම අවශ්‍ය නොවන නිර්මාණ ඉවත් කිරීම මෙම වටයෙන් සිදු කෙරේ. මෙහිදී ''ඇතුළු කිරීම හෝ නොකිරීම'' යන පදනම යටතේ විනිශ්චය සිදු කෙරෙනු ඇත. යම් ඉදිරිපත් කිරීමක් එක විනිශ්චය කරුවකු විසින් පමනක් හෝ තෝරා ගනු ලැබුව ද එය දෙවැනි වටය කරා රැගෙන යනු ඇත.

## දෙවන වටය

පළමු වටයේදී සුදුසුකම් ලැබූ සියලු නිර්මාණ විශේෂිත මිනුම් දඬුවලට අනුව විනිශ්චය කරනු ඇත. තරග ඉසව් ඉංග්‍රිසි උපදෙස් මාලාවේ වගු 1, 2 සහ 3 වලින් දක්වා ඇති අයුරින් 70% ක් ලකුණු ලබාදීම සිදුකෙරේ. ඒ අනුව අනුව 1 වන මිණුම පිළිබඳ වගකීම මුද්‍රණකරු සතුවන අතර 2 වන හා 3 වන මිනුම් කෙරෙහි සෘජු බලපෑම ද ඔහු සතුය. ඉසව් 10-14 දක්වා මෙම ලකුනු එකතුව 60% වනු ඇත.

## තෙවන වටය

දෙවන වටයේදී දෙනු ලැබූ ලකුණු වගුගත කෙරෙන අතර තෝරා ගනු ලබන හොඳම නිර්මාණ 3 සඳහා අතිවිශිෂ්ට විශිෂ්ට හා කුසලතා යන වශයෙන් සම්මාන පිරිනැමෙනු ඇත.

තමන් ඉදිරිපත් කරනු ලබන නිර්මාණ වෙනුවෙන් ඉහළම ලකුණු වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා මුද්‍රණකරුවාට වසරේ විශිෂ්ටතම මුද්‍රණකරුවාට හිමි සම්මානය පිරිනමනු ලැබේ.

පළමු වරට ජයග්‍රහණය කළ නිර්මාණ අතරින් වැඩිම ලකුණු ලබාගත් නිර්මාණයට විශේෂ ඇගයීම් සම්මානය පිරිනැමෙනු ඇත.

යම් හෙයකින් අවසන් ලකුණු සමාන වන අවස්ථා වුවහොත්, විනිසුරුවරුන්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

## ලකුණු දීමේ උපමානයන්

ලකුනු දීමේ ක්‍රමවේදය උදෙසා ඉංග්‍රිසි උපදෙස් මාලාවේ වගු 1, 2 සහ 3 බලන්න. ඒවායේ සංයුතිය එක් එක් ඉසව් සඳහා වෙනස් වන බව ද සලකන්න.

1 රිප්‍රෝ (Repro) : මුද්‍රණ කාර්යයට/ උපස්ථරයට යෙදූ තිර රේඛාවන්හි යෝග්‍යතාවය, අවශ්‍ය අවස්ථාවන්හිදී ට්‍රැපිං භාවිතාව, කාර්ය සඳහා උචිත බව, ස්කෑන් කිරීමෙහි ගුණාත්මක බව, සුදුසු තැන් වලදී හයිලයිට් ෂැඩෝ යෙදීම ආදිය, අනුරූපයන්හි ගුණාත්මක භාවය, සුදුසු පරිදි වර්ණයන්හි විලක්ෂණය,

2 මුද්‍රණය (Printing)ඃ මුද්‍රණ ක්‍රියාවලියේ හා යොදාගත් ද්‍රව්‍යයන්ගේ යෝග්‍යය බව, තීන්ත පටලයේ ඝනත්වය, වර්ණයන්ගේ පිරිසිදු බව, තිත් විශාලනය පාලනය, පෘශ්ඨය මතුපිට මුද්‍රණයේ සමානත්වය, තීන්ත අතර රෙජිස්ටර් වීම, ඉදිරිපස සහ පසුපස මුද්‍රණ අතර රෙජිස්ටර් වීම,

3 නිමාව (Finish)ඃ නිවැරදි ස්ථානගත කිරීම ආදිය, සුපිරිසිදු මතුපිටක් ලබාගැනීම හා පවත්වා ගැනීම සඳහා මුද්‍රණයේ ක්‍රමවත් බව, පසු මුද්‍රණ අදියර වල විශිෂ්ටත්වය, කැපීමේ නිරවද්‍යතාව, බැඳීම, ලැමිනේට්, නැවීම, ඇලවීම කිරීමේ ගුණාත්මක බව

4 නිර්මාණය සහ සංකල්ප (Design & Concept) : නිර්මාණයෙහි දෘශ්‍යමය බලපෑම, වර්ණ සුසංයෝගය, මුද්‍රණ අක්ෂර ගැලපීම, දෘශ්‍යමය නිර්මාණය එහි බලාපොරොත්තු නිශ්චිත අරමුණ ඉටු කර ලීම කෙරෙහි ඇතිකරන බලපෑමෙහි ප්‍රමාණය

5 නව්‍යකරණය (Innovation) : නැවුම් ඉදිරිපත් කිරීමක් උදෙසා පරිකල්පනය භාවිතා කිරීම, නිෂ්පාදනයක පරිනාමය උදෙසා ලබා දෙන මූලිකත්වය, පෙනුම, සුවඳ, ස්පර්ශය වැනි බහු සංවේදනා සඳහා මුද්‍රණයට සම්බන්ධ උපක්‍රම භාවිතාව, මුද්‍රණ කර්මාන්තය සඳහා නව වෙලඳ පොල සොයා යෑම, තිබෙන සම්පත් උපරිමව ප්‍රයොජනයට ගෙන වැඩි අගයක් කරා යාම ආදිය

## විශේෂ සටහන

විනිශ්චය කරුවන්ට යම් යම් අවස්ථාවලදී විනිශ්චය කිරීමේ උපමාන, යම් ඉසව්වකට ඉදිරිපත් කර ඇති නිර්මාණ වලට අනුකූලව, ඔවුන් ගේ අභිමතය පරිදි, ඔවුන් සෑම දෙනාම එකඟවන ඒකමතික තීරනයකට අනුව, ඉදිරිපත් වී ඇති සියළුම තරග කරුවනට අසාධාරනයක් නොවන පරිදි වෙනස් කිරීමේ බලතල ඇත.

තරග ඉසව් ගනුදෙනු කරුවන් මුද්‍රිත නිර්මාණයක් කුමන ආකාරයකට දකින්නේ ද යන්න මත ඉදිරි පත් කර ඇත. මුද්‍රණකරුවකු යම් නිර්මාණයක් ඉතා ඉහල තත්වයකින් මුද්‍රණය කිරීමේ තාක්ෂනික අභියෝග තේරුම් ගත්තද එය භාවිතා කරන්නා එය තමා බලාපොරොත්තුවන අරමුණ නිශ්චිතව ඉටු කරන්නේද යන්න ගැන පමනක් උනන්දු වෙනු ඇත. ඒ අනුව එක් එක් මුද්‍රිත නිර්මාණයක් ඒවාට සුවිශේෂවූ උපමානයනට අනුව විනිශ්චය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.